# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 464 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 16/03/2024 පැය 1616

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**ද්‍රවිඩ භාෂාවෙන් පැමිණිලි සහ තොරතුරු ලබා දීම සඳහා "107" හදිසි දුරකථන ඇමතුම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම - පොලිස් මූලස්ථානය.**

පැය 24 පුරා ක්‍රියාත්මක "107" හදිසි දුරකථන ඇමතුම් මධ්‍යස්ථානයක් 2024.03.16 වන අද දින වව්නියාව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලයේදී ගරු මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වියානි ගුණතිලක මහතා හා පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා ඇතුළු උසස් පොලිස් නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ආරම්භ කිරීමට කටයුතු කරන ලදි.

මෙය ගරු මහජන ආරක්ෂක අමාත්‍යතුමාගේ සහ පොලිස්පතිතුමාගේ අදහසකට අනුව ගරු ජනාධිපති තුමාගේ මගපෙන්වීම මත උතුරු නැනෙහිර පදිංචි ද්‍රවිඩ ජනතාව මූලික කරගෙන මෙම"107" හදිසි දුරකථන අංකය පැය 24 පුරා ක්‍රියාත්මක වන අතර ද්‍රවිඩ භාෂාවෙන් කටයුතු කල හැකි නිලධාරීන් මෙම මධ්‍යස්ථානයේ රාජකාරී යොදවා ඇත. මෙම හදිසි ඇමතුම් අංකය වෙත සිංහල භාෂාවෙන්ද පැමිණිලි හා තොරතුරු ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.

මෙමඟින් උතුරු නැගෙනහිර පලාත්වල පදිංචි සහ එම ප්‍රදේශ වලට අවශ්‍යතාවයන් සඳහා පැමිණෙන ජනතාවගේ ජීවිත හා දේපල වලට තර්ජනයක් හෝ අනතුරක් පවතින හදිසි අවස්ථාවක දී මෙම හදිසි දුරකථන ඇමතුම් මධ්‍යස්ථානය අමතා පොලිසියේ සහය ලබා ගැනීම සඳහා අවකාශය සැලසෙනු ඇත.

මෙම දුරකථන අංකය වෙත අපරාධමය ක්‍රියා හා අපරාධකරුවන් පිළිබඳ තොරතුරු, නීති විරෝධී මත්ද්‍රව්‍ය හා මත්පැන් මෙන්ම බෙදා හරින්නන් පිළිබඳ තොරතුරු, පාරිසරික දූෂණ ක්‍රියා පිළිබඳ තොරතුරු, රිය අනතුරු, බරපතල මහජන පීඩා, ස්වාභාවික සහ මිනිස් ක්‍රියාකාරකම් මත සිදුවන විපත් ආදිය පිළිබඳ නිවැරදි තොරතුරු ලබා දීමට හැකියාව ඇත.

උතුරු නැගෙනහිර ජනතාවට කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් ලබා දීම මෙම මධ්‍යස්ථානය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වන අතර මෙම දුරකථන මධ්‍යස්ථානය වෙත ලැබෙන සියළුම තොරතුරු වල රහස්‍ය භාවය ආරක්ෂා කිරීමට කටයුතු කරනු ඇත.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක් මේ සමග එවමි.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.